# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2107/24 - 2019 ජනවාරි මස 23 වැනි බදාදා - 2019.01.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

15(1) වගන්තිය යටතේ නියමය

මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය, පාඨලී චම්පික රණවක වන මම, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 15 (1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, දෙහිවල ගල්කිස්ස මහනගර සභාව වෙත පැවරී ඇති ඉඩමක් වශයෙන් මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් වඩාත් පූර්ණ ලෙස විස්තර කර ඇති ඉඩම අද දින සිට ක්‍රියාත්මක වන පරිදි නාගරික සංවර්ධන අධිකාරිය වෙත මෙම නියෝගය මගින් සතු කරමි.

පාඨලී චම්පික රණවක (පා.ම.),
මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2019 ජනවාරි මස 18 වැනි දින,
අංක 17 හා 18 මහල,
සුහුරුපාය,
බත්තරමුල්ල,
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ ගල්කිස්ස ගමේ පිහිටි ගල්කිස්ස වත්ත නැමති උතුරින් දුම්රියපොල පාර ද නැගෙනහිරින් ගාලු පාර ද දකුණින් දුම්රියපල පාර පිහිටි බී. ජේ. පෙරේරා හිමිකම් දක්වන වරිපනම් අංක 8 දරන ඉඩමද බටහිරින් පරණ දුම්රියපොල පාර ද මායිම් වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි අටයි එකයි එකක් (හෙක්. 0.0811) වූ බලයලත් මිනින්දෝරු එම්. ඩබ්. එල්. අයි. අයි. පීරිස් මහතා විසින් මැන පිළියෙල කරන ලද අංක 1202 දරන මානක සැලැස්මේ කැබලි අංක 3 දරන බිම් කොටස.

02 - 250

1A - G 29301 — 19 (2019/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*